ගොවිජන සංවර්ධන දෙපාර්තමේන්තුව
கமநல அபிவிருத்தித் திணைக்களம்
DEPARTMENT OF AGRARIAN DEVELOPMENT

මගේ අංකය / எனது இல. / My No. 7/5/4 - බීජ බැංකු
ඔබේ අංකය / உமது இல. / Your No.
දිනය / திகதி / Date 2020.05. 12

## චක්‍රලේඛ අංක 05/2020 - සංශෝධන (I)

සියලුම දිස්ත්‍රික් භාර ගොවිජන සංවර්ධන නියෝජ්‍ය / සහකාර කොමසාරිස්වරුන් වෙත,
සියලුම ගොවිජන සංවර්ධන ප්‍රාදේශීය නිලධාරීන් වෙත,

### දේශීය කෘෂි බීජ සංරක්ෂණය හා ව්‍යාප්ත කිරීම සඳහා සෞභාග්‍යා ගොවිජන බීජ බැංකුව ස්ථාපිත කිරීම

උක්ත කරුණ සම්බන්ධයෙන් මා විසින් නිකුත් කරන ලද 2020.04.01 දිනැති අංක 05/2020 චක්‍රලේඛයට අලුතින් කරුණු ඇතුළත් කිරීම සඳහා මෙම සංශෝධන චක්‍රලේඛය නිකුත් කරමි.

02. ඒ අනුව සෞභාග්‍යා ගොවිජන බීජ බැංකුව ක්‍රියාත්මක කිරීමේ දී පහත කරුණු පිළිබඳව අවධානය යොමු කළ යුතු ය.

**I. මව් බීජ මිලදී ගැනීම**

සෞභාග්‍යා ගොවිජන බීජ බැංකුවේ ගබඩා කිරීම සඳහා නියමිත ප්‍රමිතියෙන් යුත් මව් බීජ මිලදී ගැනීමට පහත කොන්දේසිවලට යටත්ව ගොවිජන සේවා කාරක සභා අරමුදල් යෙදවීම සිදු කළ යුතුය.

**(අ)** මව් බීජ මිලදී ගැනීම කෘෂිකර්ම දෙපාර්තමේන්තුවෙන් හෝ සුදුසු බීජ නිෂ්පාදකයෙකුගෙන් පමණක් සිදු කළ යුතු ය.

**(ආ)** මිලදී ගනු ලබන බීජ වර්ගය, ප්‍රමාණය හා සැපයිය යුතු කාලවකවානු ඉහත (අ) හි සඳහන් ආයතන/ බීජ නිෂ්පාදකයන් වෙත පූර්ව දැනුවත් කිරීමක් කර මිල ගණන් ලබා ගත යුතුය.

**(ඇ)** අදාළ මිල ගණන් අනුව ගොවිජන සේවා කාරක සභාව විසින් බීජ මිලදී ගන්නා ආයතනය, බීජ වර්ග හා මිලදී ගන්නා බීජ ප්‍රමාණය තීරණය කළ යුතු ය.

**(ඈ)** මිලදී ගනු ලබන බීජ නියමිත ප්‍රමිතියෙන් යුතු බවට සහ කල් ඉකුත් වන දිනය ඇතුළත් සහතිකයක් ලබා ගැනීම අනිවාර්යය වේ.

ගොවිජන සංවර්ධන දෙපාර්තමේන්තුව, අංක 42, ශ්‍රීමත් මාර්කස් ප්‍රනාන්දු මාවත, තැ.පෙ. 537, කොළඹ 07.
கமநல அபிவிருத்தித் திணைக்களம், இல. 42, சேர் மார்கஸ் பெர்னாந்து மாவத்தை, அ.பெ. 537, கொழும்பு 07.
DEPARTMENT OF AGRARIAN DEVELOPMENT, No. 42, SIR MARCUS FERNANDO MAWATHA, P.O. BOX. 537, COLOMBO 07.
දුරකථන/ தொலைபேசி/ Telephones :
පොදු කාර්යාලය / பொது அலுவலகம் / General Office: 011 2694231, 011 2694232, 011 2694233, 011 2694234
ගොවිජන සංවර්ධන කොමසාරිස් ජනරාල් / கமநல அபிவிருத்தி ஆணையாளர் நாயகம் / Commissioner General of Agrarian Development: 011 2691060
ෆැක්ස් / தொலை நகல் / Fax: 011 2693572, 011 2691843, 011 2674481
E - mail : commissionerdad@yahoo.com
විදුලි පණිවුඩ / தந்தி / Telegram: ගොවිජනසේවා / கொவிசேவா / Agraservis

(ඉ) සෑම මව් බීජ මිලදී ගන්නා අවස්ථාවකදී ම බීජ මිලදී ගත් ආයතනය, මිලදී ගත් බීජ වර්ග අනුව ප්‍රමාණයන් සහ ගෙවන ලද මුදල ඇතුළත් තොරතුරු අදාළ දිස්ත්‍රික් නියෝජ්‍ය/ සහකාර කොමසාරිස් වෙත වාර්තා කිරීම බීජ බැංකුව භාර ගොවිජන සංවර්ධන ප්‍රාදේශීය නිලධාරී විසින් සිදු කළ යුතු ය.

(ඊ) රජයේ මුදල් රෙගුලාසි සහ දෙපාර්තමේන්තු චක්‍රලේඛවලට පටහැනිව ගොවිජන සේවා කාරක සභා අරමුදල් බීජ මිලදී ගැනීම සඳහා යෙදවීම නොකළ යුතු ය.

**II. බීජ නිෂ්පාදකයන්ගේ ගොවි සංවිධාන පිහිටුවීම.**

**(අ)** ගොවිජන සේවා බල ප්‍රදේශ මට්ටමින් ලියාපදිංචි කරනු ලබන බීජ නිෂ්පාදකයන්ගේ සාමාජිකත්වයෙන් යුතු බීජ නිෂ්පාදකයන්ගේ ගොවි සංවිධාන ප්‍රාදේශීය / දිස්ත්‍රික් මට්ටමින් පිහිටුවිය යුතුය.

**(ආ)** එසේ පිහිටුවන ලබන සෑම ගොවි සංවිධානයක්ම 2011 අංක 46 දරන ගොවිජන සංවර්ධන (සංශෝධන) පනතින් සංශෝධිත 2000 අංක 46 දරන ගොවිජන සංවර්ධන පනතේ 43 (2) උප වගන්තියට යටතේ ලියා පදිංචි කළ යුතු ය.

**(ඇ)** ප්‍රාදේශීය / දිස්ත්‍රික් මට්ටමින් පිහිටුවනු ලබන බීජ නිෂ්පාදකයන්ගේ ගොවි සංවිධාන සාමාජිකයන්ගෙන් තෝරාපත් කර ගනු ලබන දෙදෙනෙකුගෙන් සමන්විත සංඛ්‍යාවක් ඇතුළත් වන පරිදි බීජ නිෂ්පාදකයන්ගේ ජාතික ගොවි සංවිධානයක් පිහිටුවනු ඇත.

**(ඈ)** බීජ නිෂ්පාදකයන්ගේ ගොවි සංවිධානවලට සහ බීජ නිෂ්පාදකයන්ගේ ජාතික ගොවි සංවිධානයට අදාළ වන කාර්යයන්, බලතල, වගකීම් සහ අනෙකුත් විධිවිධාන ඇතුළත් ආදර්ශ අතුරු ව්‍යවස්ථාවක් කඩිනමින් නිකුත් කරනු ඇත.

**(ඉ)** ප්‍රාදේශීය මට්ටමෙන් ගොවි සංවිධානයක් ලියාපදිංචි කරනු ලබන්නේ නම් එම සංවිධානයෙන් තෝරා පත් කර ගනු ලබන නියෝජිතයන් දෙදෙනෙකු දිස්ත්‍රික් ගොවි සංවිධානයේ සාමාජිකත්වයට පත් කළ යුතු ය. එසේ නොවන අවස්ථාවක අදාළ ගොවිජන සංවර්ධන ප්‍රාදේශීය නිලධාරී විසින් ක්‍රියාකාරී බීජ නිෂ්පාදකයෙකු දිස්ත්‍රික් ගොවි සංවිධානයට නම් කළ යුතු ය.

**III. සෞභාග්‍යා ගොවිජන බීජ බැංකුවේ ක්‍රියාත්මක යාන්ත්‍රණය**

ගොවිජන බීජ බැංකුවේ ක්‍රියාත්මක යාන්ත්‍රණය S/B/01 ඇමුණුමෙහි දක්වා ඇත. ප්‍රාදේශීය බීජ බැංකු සියල්ලම ජාලගත කර ගොවි ජනතාව වෙත උපරිම කාර්යක්ෂමතාවයකින් බීජ බැංකුවට අදාළ වන සේවය ලබා දීම සඳහා **2020.05.31** දිනෙන් අවසන් මාසයේ සිට සෑම මාසයකටම වරක් **S/B/02** ආකෘතියෙන් බීජ වර්ග අනුව අදාළ තොරතුරු ජාතික මෙහෙයුම් කමිටුව වෙත වාර්තා කළ යුතුය. ඊට අදාළ වන වාර්තා ප්‍රධාන කාර්යාලයේ ආයතනික සංවර්ධන අංශයේ විද්‍යුත් ලිපිනය වන insdv.dad@gmail.com වෙත යොමු කළ යුතු ය.

## IV. ප්‍රාදේශීය හා දිස්ත්‍රික් මට්ටමින් ප්‍රගතිය සමාලෝචනය කිරීම

(අ) සෞභාග්‍යා ගොවිජන බීජ බැංකුවට අදාළ ක්‍රියාත්මක යාන්ත්‍රණය සම්බන්ධව ප්‍රගතිය සමාලෝචනය කිරීම නව යෝජනා සහ අදහස් ජාතික මෙහෙයුම් කමිටුව වෙත වාර්තා කිරීම සඳහා ප්‍රාදේශීය හා දිස්ත්‍රික් මට්ටමින් ප්‍රගතිය සමාලෝචනය කළ යුතුය.

(ආ) ප්‍රාදේශීය ලේකම්ගේ ප්‍රධානත්වයෙන් පැවැත්වෙන ප්‍රාදේශීය කෘෂිකර්ම කමිටු රැස්වීමේ දී ප්‍රාදේශීය මට්ටමින් ප්‍රගතිය සමාලෝචනය කළ යුතු ය. ප්‍රාදේශීය මට්ටමින් ගනු ලබන තීරණ දිස්ත්‍රික් කෘෂිකර්ම කමිටුව වෙත ඉදිරිපත් කළ යුතු ය.

(ඇ) දිස්ත්‍රික් ලේකම්ගේ ප්‍රධානත්වයෙන් පැවැත්වෙන දිස්ත්‍රික් කෘෂිකර්ම කමිටු රැස්වීමේ දී දිස්ත්‍රික් මට්ටමින් ප්‍රගතිය සමාලෝචනය කළ යුතු ය. දිස්ත්‍රික් මට්ටමින් ගනු ලබන තීරණ ජාතික මෙහෙයුම් කමිටුව වෙත ඉදිරිපත් කළ යුතු ය.

## V. "සෞභාග්‍යා ගොවිජන බීජ බැංකුව" බීජ පනතට අනුකූල විය යුතු වීම.

2003 අංක 22 දරන බීජ පනතට අනුකූලව සෞභාග්‍යා ගොවිජන බීජ බැංකුවට අදාළව සියලු කටයුතු පවත්වාගෙන යාම අනිවාර්යය වේ.

03. සාම්ප්‍රදායික කෘෂිකාර්මික ජීවන රටාවේ උරුමයන් මතු පරපුරට දායාද කරමින් දේශීය කෘෂිකර්මාන්තයේ ප්‍රගමණනය උදෙසා ක්‍රියාත්මක සෞභාග්‍යා ගොවිජන බීජ බැංකුව තුළින් සෞභාග්‍යාමත් දේශයක් ගොඩනැගීම සඳහා ඔබ ඇතුළු සමස්ථ කාර්යය මණ්ඩලයේ උපරිම දායකත්වය මේ සඳහා ලබා දෙන ලෙස දන්වමි.


ඩබ්.එම්.එම්.බී වීරසේකර,
ගොවිජන සංවර්ධන කොමසාරිස් ජනරාල්.

පිටපත් :

1. ගරු බැසිල් රාජපක්ෂ මැතිතුමා - ජනාධිපති විශේෂ කාර්යය සාධන බලකාය - කා.දැ.ස.
2. ලේකම් - මහවැලි කෘෂිකර්ම වාරිමාර්ග සහ ග්‍රාමීය සංවර්ධන අමාත්‍යාංශය - කා.දැ.ස.
3. අධ්‍යක්ෂ ජනරාල් - කෘෂිකර්ම දෙපාර්තමේන්තුව - අවශ්‍ය කටයුතු සඳහා.
4. අධ්‍යක්ෂ ජනරාල් - වාරිමාර්ග දෙපාර්තමේන්තුව - කා.දැ.ස.
5. අධ්‍යක්ෂ ජනරාල් - මහවැලි සංවර්ධන අධිකාරිය - කා.දැ.ස.
6. සියලුම පළාත් ප්‍රධාන ලේකම්වරුන් - කා.දැ.ස.
7. සියලුම දිස්ත්‍රික් ලේකම්වරුන් - අවශ්‍ය කටයුතු සඳහා.
8. සියලුම පළාත් කෘෂිකර්ම ලේකම්වරුන් - කා.දැ.ස.
9. සියලුම ප්‍රාදේශීය ලේකම්වරුන් - අවශ්‍ය කටයුතු සඳහා.
10. සියලුම පළාත් කෘෂිකර්ම අධ්‍යක්ෂකවරුන් - අවශ්‍ය කටයුතු සඳහා.

# සෞභාග්‍යා ගොවිජන බීජ බැංකුව

## ක්‍රියාත්මක යාන්ත්‍රණය



**S/B/02**

# දේශීය කෘෂි බීජ සංරක්ෂණය හා ව්‍යාප්ත කිරීම සඳහා වන සෞභාග්‍යා ගොවිජන බීජ බැංකුව

## මාසික ප්‍රගති වාර්තාව

............................ දින සිට ........................... දින දක්වා ප්‍රගතිය

(බීජ බැංකුව ආරම්භ කළ දිනය) (තොරතුරු ඉදිරිපත් කරන දිනය)

දිස්ත්‍රික්කය :- ............................ බීජ වර්ගය :- ....................................

| අනු අංකය | ගො.සේ.ම. (බීජ බැංකුව) | බීජ බැංකුව වෙත මව්බීජ සපයා ගැනීම | | බීජ බැංකුව විසින් බීජ නිෂ්පාදකයන් වෙත බීජ ලබා දීම | | බීජ නිෂ්පාදකයන් විසින් බීජ බැංකුව වෙත නොමිලේ බීජ සැපයීම | | බීජ නිෂ්පාදකයන්ගෙන් බීජ බැංකුව වෙත බීජ මුදලට ලබා ගැනීම | | වගාකරුවන් වෙත බීජ නිකුත් කිරීම | | තොරතුරු ඉදිරිපත් කරන දිනට බීජ බැංකුව සතුව පවතින තොග කත්ත්වය | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | | ප්‍රමාණය (KG) | ගැනුම් වටිනාකම (රු.) | නිෂ්පාදකයන් සංඛ්‍යාව | ප්‍රමාණය (KG) | නිෂ්පාදකයන් සංඛ්‍යාව | ප්‍රමාණය (KG) | නිෂ්පාදකයන් සංඛ්‍යාව | ප්‍රමාණය (KG) | වගාකරුවන් සංඛ්‍යාව | ප්‍රමාණය (KG) | ප්‍රමාණය (KG) | කිලෝ ග්‍රෑම් එකක විකුණුම් මිල (රු.) |
| | | | | | | | | | | | | | |
| | | | | | | | | | | | | | |
| | | | | | | | | | | | | | |
| | | | | | | | | | | | | | |
| | | | | | | | | | | | | | |
| | | | | | | | | | | | | | |
| | | | | | | | | | | | | | |
| | | | | | | | | | | | | | |
| | | | | | | | | | | | | | |
| | | | | | | | | | | | | | |
| | | | | | | | | | | | | | |
| | | | | | | | | | | | | | |
| | | | | | | | | | | | | | |
| | | | | | | | | | | | | | |
| | | | | | | | | | | | | | |
| | | | | | | | | | | | | | |
| | | | | | | | | | | | | | |
| | | | | | | | | | | | | | |
| එකතුව | | | | | | | | | | | | | |

සකස් කළේ :- ................................ පරීක්ෂා කළේ :- ................................ සහතික කළේ :- ................................

නි.කො. / ස.කෝ.